දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය

Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ප්‍රථම භාග - 2015 හා 2019 (පුනර් 2015) පරීක්ෂණය - 2020 පෙබරවාරි/මාර්තු

Bachelor of Arts General (External) Degree Part I – 2015 & 2019 (2015 Repeat) Examination–February/March 2020

සිංසා 2.1 - සම්භාව්‍ය සිංහල පද්‍ය කාව්‍යය හා ව්‍යාකරණ සම්ප්‍රදාය

# SLG 2.1 - Classical Sinhala Poetry and the Grammatical Tradition

කාලය පැය තුන යි

පළමුවන කොටසට හා II, III කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරා ගෙන,
ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න
නො පැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු කෙරේ

---

## පළමුවන කොටස

01. පහත දැක්වෙන පද්‍යවල අර්ථ ලිහිල් බසින් ලියා අංකිත පදවලට ලුහුඬු විවරණ සපයන්න.

(අ) රිවිකල්හු යත විල් හසවැල හළ මෙවුල්දම්
පියුම් දඟ බිඟුරැව්නෙන් වනසොවිනි ගුගුරා මෙන්

තමරැස් නුබද සඳ කැලුම් පතර දිස්නේ ගුවන්
නිසවමිය පලන් කඩුපුල් පුල් විලස්නෙන්

(කව්සිළුමිණ, ඇම්.බී. ආරියපාල සංස්.)

(ආ) නල මුදු සුවඳ පිරි කුඹු මියුරු අඹ ගෙඩි
පුල හෙළ කුසුම ලිය පිය තෙපල රන් කෙඬි
සල සුදු සෙමෙර සේසත් ගිජිඳුනොද වැඩි
බල සුබ නිමිති පෙර මඟ නැකතටත් වැඩි

ලොවැ විහිදා සුදු පැහැ සඳ රැසෙව් සැදි
දෙන නොමඳා සිරි සග මොක් සැප නිසැදි
ලද මුනිඳා දම් කඳ පහස මන බැඳි
වඳු දළදා හිමි තෙ මහල් පහය රැඳි

(සැළලිහිණි සන්දේශය, සුචරිත ගම්ලත් (සංස්.))

(ඇ) සුවඳ කුසුම් වරලසෙ හී
පැලඳ කපුරු හර උරෙ හී
නොමඳ බරණ ලා සර හී
නිබඳ කෙලිති ලියො පුරෙ හී

පසුකර රුසිරෙන් සුර ඹා
ගොස කර රන් මිණි සල ඹා
එනුවර කෙළි රඟ පුර ඹා
බඹසර සිත වත් කල ඹා

(ගුත්තිල කාව්‍යය, ඩබ්.එම්. ගුණවර්ධන (සංස්.))

(ඈ) සතතින් පටන් අඹ කොළ බුදින තවස ර
දූහැනින් මිදේ දුට ළෙල දෙන ලිය තඹ ර
බුදිමින් අයෙක් කිරි තෙල් දී රස අහ ර
ඉඳුරන් දමත සිඳු ඉපිලෙ'ව් මඳර ගි ර

නොමදත් අයෙක් ගැඹරින් යුත් <u>සද සත ර</u>
පදරුත් වියකමැයි සලකනු සබය තු ර
මදමත් තුඟු මහත් වන ගිජිඳකු ළ ත ර
සියපත් හුයින් බඳිනට තැත් කරනු යු ර

(සුභාෂිතය, සුචරිත ගම්ලත් (සංස්.))

(ලකුණු 28)

## දෙවන කොටස

02. "කව්සිළුමිණ කවියාගේ මූලික අභිමතාර්ථය වූයේ බෝධිසත්ව ගුණෝපේත චරිතයක සම්පාදනයක් නො ව පාඨකයා වශීභාවයට පත් කෙරෙන රසාලිප්ත ප්‍රේම කාව්‍යයක නිමැවුමකි." නිර්දිෂ්ට සර්ගවලින් නිදසුන් තෝරා ගෙන විමසීමක යෙදෙන්න.

03. සැළලිහිණි සන්දේශයේ දක්වෙන ආශිර්වාද, දූත ප්‍රශංසා, ගමන් පිරුම සහ මාර්ග යන වැණුම් ඇසුරෙන් තද් කවියාගේ 'කාව්‍ය ප්‍රතිභාව' නිරීක්ෂණය කරන්න.

04. "සිලිටි සරල බසින් සිව්පදයට නැඟුණු එක ම ජාතක කථාව ගුත්තිල කාව්‍යය යි" සනිදර්ශන ව සාකච්ඡා කරන්න.

05. හුදු උපදේශ කෘතියකට වඩා කාව්‍යාලංකාර සහිත උපදේශ කාව්‍යය පාඨක රස ප්‍රතීතිය මුවහත් කරයි" විභාග කරන්න.

## තෙවන කොටස

06. i. සිංහල භාෂා ඉතිහාසයෙහි විවිධ අවධිවල භාවිත වුණු අක්ෂර මාලා පහක් අනුක්‍රමික ව දක්වන්න. (ස්වර ව්‍යංජන සංඛ්‍යාව සහ කාල වකවානුව දැක්වීම ප්‍රමාණවත් ය.)

    ii. කව්ලකුණු මිණිමල් හෝඩිය ඊට පෙර භාවිත වුණු හෝඩිවලින් වෙනස් වන්නේ කවර ලක්ෂණ හේතු කොට ගෙන ද?

    iii. ඩබ්ලිව්.එෆ්. ගුණවර්ධන සහ ඒ. මැන්දිස් ගුණසේකර සිංහල හෝඩිය විෂයයෙහි කවර සංස්කරණ සිදු කළේ ද යන්න සැකෙවින් පහදන්න.

07. සිදත් සඟරව සන්ධි හඳුන්වා ඇත්තේ කෙසේ ද? එහි දක්වා ඇති මූලික සන්ධි විධි මොනවා ද? අභ්‍යන්තර සන්ධි සහ බාහිර සන්ධි යනු කවරේ ද? වර්තමාන භාෂා ව්‍යවහාරයට සිදත් සඟරා විග්‍රහය ප්‍රමාණවත් දැයි පෙන්වා දෙන්න. කුමාරතුංග මුනිදාස හෝ ඩබ්ලිව්.එස්. කරුණාතිලක සන්ධි නිර්වචනය කර ඇති අයුරු දක්වන්න.

08. පද සාධනයෙහි සාවද්‍ය ව්‍යවහාර, විභක්ත්‍යන්ත රූප සාධනයට අදාළ ව සාවද්‍ය රූපය, ප්‍රකෘතිය, නිරවද්‍ය රූපය ද සන්ධි කාර්යයට අදාළ ව සාවද්‍ය රූපය, විසන්ධිය, නිරවද්‍ය රූපය, නොමඟ යැවූ රූපය ද සහිත ව වෙන් වෙන් ව දක්වා නිදසුන් හතර බැගින් සපයා පැහැදිලි කරන්න.

09. i. සිදත් සඟරාවේ දක්වා ඇති උපසර්ග විග්‍රහය පැහැදිලි කර වත්මන් ව්‍යවහාරයට එහි සප්‍රමාණ බව සාකච්ඡා කරන්න.

ii. පහත පද අතුරෙන් උපසර්ග සහ උපසර්ග නොවන පද තෝරා වෙන වෙන ම වර්ග කරන්න.

අවකාශ/අවගුණ/අවඥා/අවතක්සේරු/අතිරේක/අතිශය/අවතීර්ණ/අවදානම්/අවධානය/
අවධිය/අවනත/අවනම්බුව/අවශේෂය/අවපාට/අවප්‍රමාණ/අවබෝධය/අවයව/
අවමංගල්‍යය/අවවාද/අවසාන/අවධාරණය/පරිසරය/සම්මේලන/පිරිකර/
අධිකාරම්/අපදාන/අපනයන/සංවර/පරිණාම/අතිරේක/සම්ප්‍රදාය/විනෝද

(අංක 02 - 09 දක්වා පිළිතුරුවලට ලකුණු 18 බැගිනි)

************************************